**තේ පර්යේෂණ මණ්ඩලය - 2012**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට තේ පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS)

2012 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා නව ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අනුගමනය කළයුතු වුවද, මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(අ) වර්තමානයේ භාවිතයේ පවතින ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගයට දක්වා නොතිබුණි. තවද මෙම ප්‍රමිතියට අනුව ඉඩම් හා ගොඩනැගිලි වෙනම වත්කම් වන අතර වෙනම ගිණුම් ගත කළයුතුය. කෙසේ වුවද මණ්ඩලය විසින් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම ගිණුම්වල එකට දක්වා තිබුණි.

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සිදු කිරීම භාරගෙන ඇති බවත් එය දැනට බොහෝ දුරට නිම වී ඇති බවත් සභාපති විසින් ඔහුගේ පිළිතුරෙහි දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පාරිතෝෂික ප්‍රතිපාදන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ට අනුකූලව ප්‍රමාණනය කර නොතිබුණි.

(ඇ) මණ්ඩලයට එරෙහිව උසාවියේ ගොනුකර තිබූ නඩුවලින් සිදු වියහැකි අසම්භාව්‍ය බැරකම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 ප්‍රකාරව හෙළිදරව් කර නොතිබුණි.

### 1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

යන්ත්‍ර හා උපකරණ වලට අදාල ක්ෂය අනුපාතයන් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ දක්වා නොතිබුණි.

සමාලෝචිත වර්ෂය තුළ ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් වූ බව දක්වා තිබුණද පෙර වර්ෂය සමඟ සැසඳීමේදී කිසිදු වෙනස්කමක් සිදුකර නොතිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වතු සේවකයන්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් මණ්ඩලය විසින් වැවිලි මානව සංවර්ධන භාරයට රු.193,014 ක් වූ සාමාජික ගාස්තු ගෙවා තිබූ අතර එය ලාභයට අය කිරීමෙන් තොරව ඉදිකිරීම් යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට සත්‍යාපන වාර්තා අනුව, වලහන්දුව රසායනාගාරය හා දෙණියාය ව්‍යාප්ත මධ්‍යස්ථානයෙහි මාර්ගස්ථ මුදල් රු.121,128 ක් මූල්‍ය ප්‍රකාශනවල මාර්ගස්ථ මුදල් ලෙස වෙනම දක්වනු වෙනුවට මුදල් යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරියෙකු සඳහා රු.100,265 ක මුදලක් පාරිතෝෂික වශයෙන් ගෙවා තිබුණද ඔහු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේදී නැවත පාරිතෝෂිත වශයෙන් ඒ හා සමාන මුදලක් ප්‍රතිපාදනය කර තිබුණි.

(ඈ) කෙරීගෙන යන ව්‍යාපෘති සඳහා ලැබුණු රු.මිලියන 3.34 ක ප්‍රදාන, ණයහිමියන් හා ගෙවියයුතු ශේෂ යටතේ දක්වා තිබුණි.

### 1.2.4 නොසැසඳු ශේෂයන්

උපලේඛන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන රු.13,449,924 ක් වූ නමුත් රු.12,365,666 ක මුදලක් පමණක් ලාභයට අයකර තිබුණි. එබැවින් රු.1,084,258 ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

### 1.2.5 ගිණුම්වල වැඩියෙන් හා අඩුවෙන් දැක්වීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දින 90 ක් සඳහා වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම ගිණුම්වලට ගෙන නොතිබුණි. එබැවින් ස්ථාවර තැන්පතු මත ලැබුණු හා ලැබිය යුතු පොලී ආදායම රු.155,413 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ජාතික විද්‍යා පදනමෙන් පරිත්‍යාග කරන ලද රුපියල් මිලියනයක් වටිනාකම වූ ස්වයංක්‍රීය කාලගුණ පද්ධතිය ගිණුම්වල ප්‍රාග්ධනිත කර නොතිබුණි. තවද මණ්ඩලය විසින් එම ව්‍යාපෘතිය සඳහාම වැය කරන ලද රු. 315,728 ක මුදල ගිණුම්වල ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව ලාභයට අයකර තිබුණි. එබැවින් වත්කම් ගිණුම රු.1,315,728 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර ප්‍රදාන ගිණුම රුපියල් මිලියනයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මෙතිල් බ්‍රෝමයිඩ් (Methyl Bromide) ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගන්නා ලද රු.578,372 ක් වූ පරිගණක 04 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. එබැවින් වත්කම් ගිණුම හා ප්‍රදාන ගිණුම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලයේ හා ශාන්ත කුම්බිස් වතුයායේ පිළිවෙලින් රු.885,969 ක් හා රු.725,067 ක් වූ වෙළඳ හා විවිධ ණයගැතියන් වර්ෂ 04 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ආ) විවිධ ණයගැතියන් සමඟ සමාලෝචිත වර්ෂය තුළදී ගනුදෙනු සිදු වී තිබුණද රු.97,371 ක් වූ ආරම්භක විවිධ ණයගැති ශේෂයන් අයකරගෙන නොතිබුණි.
එම මුදල මණ්ඩලයේ සුභසාධන සංගම්වලට අදාළ මුදල් බවත් 2013 වර්ෂයේදී සියළුම ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බවත් සභාපති ඔහුගේ පිළිතුරෙහි දක්වා තිබුණි.

(ඇ) පහත සඳහන් තැන්පතු අයකර ගැනීමට/නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

- (i) 1998 වර්ෂයට පෙර තැන්පත් කරන ලද රු.51,575 ක් වූ ඉන්ධන තැන්පතු
- (ii) 2010 හා 2011 වර්ෂ වලදී ලැබුණු රු.38,400 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු
- (iii) රු.61,440 ක් වූ රඳවා ගැනීම් මුදල්

## 1.2.7 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරික්ෂණය වූ නීති,රීති,රෙගුලාසි ආදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත | ස්ථාවර දීමනා මත සේවක අර්ථ සාධක අරමුදල් දායක පෙර වර්ෂවල සිට සමාලෝචිත වර්ෂයේ මැයි 30 දක්වා සේවකයන්ගෙන් අයකරගෙන නොතිබුණු අතර එම දීමනා මත සේවක හා සේව්‍ය අර්ථ සාධක අරමුදල් දායක හා සේවක භාරකාර අරමුදල් දායක ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි | |
| | - අංක 177 (1) | දෛනික රැස්කිරීම් දෛනිකව හෝ හැකි ඉක්මණින් බැංකු ගත කළයුතු වුවත් පස්සර මධ්‍යස්ථානය විසින් 2012 ජනවාරි සිට මැයි දක්වා රැස්කර තිබුණු රු.184,952 ක මුදලක් බැංකු ගත නොකර වැය කර තිබුණි. |
| | - අංක 371 (2) (ඇ) | (i) උපදෙස් ප්‍රකාරව රු.1,511,719 ක් වූ අත්තිකාරම්, දෙන ලද කාර්යය නිම කිරීමෙන් පසු වහාම නිරවුල් කර නොතිබුණි.<br>(ii) ශාන්ත කූම්බ්ස් කම්හලේ රු.15,267 ක් වූ මුදල් අත්තිකාරම් වර්ෂ 05 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි. |
| | - අංක 570 | බාහිර පාර්ශවයන් වෙත තැන්පත් කරන ලද රු.43,600 ක මුදලක් වර්ෂ 05 කට වැඩි කාලයක් ගතවී තිබුණද ඒවා අයකරගෙන නොතිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත 2012 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව |

| | | |
|---|---|---|
| | 6.5.1 ඡේදය | විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 12 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර මණ්ඩලයට අයත් ඉඩම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |
| (ඉ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් පරිදි මෝටර් වාහනවල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.මිලියන 28.7 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌනතාවය රු.මිලියන 26.8 ක් වූ බැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 1.9 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. මෙහෙයුම් වියදම් වැඩිවීම එයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 වතු පිළිබඳ මෙහෙයුම් ප්‍රතිඵල

මණ්ඩලය විසින් වතුයායන් දෙකක් එනම් ශාන්ත කුම්බ්ස් වතුයාය හා ශාන්ත ජෝකිම් වතුයාය පාලනය කරනු ලබන අතර සමාලෝචිත වර්ෂයේ එම වතුවල මෙහෙයුම් ප්‍රතිඵල ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | ශාන්ත කුම්බ්ස් වතුයාය (ලැම්ලියර් කොටසද ඇතුළුව) | | ශාන්ත ජෝකිම් වතුයාය | |
|---|---|---|---|---|
| | 2012 | 2011 | 2012 | 2011 |
| තේ විකුණුම් | | | | |
| ප්‍රමාණය (කිලෝග්‍රෑම්) | 376,712 | 344,131 | 283,065 | 396,287 |
| විකුණුම් වටිනාකම (රු.'000) | 173,875 | 141,490 | 111,773 | 144,697 |
| වෙනත් ආදායම (රු.'000) | 2,356 | 1,643 | 15,524 | 8,005 |
| මුළු ආදායම (රු.'000) | 176,231 | 143,133 | 127,297 | 152,702 |
| අඩු කළා-: | | | | |
| මුළු වියදම (රු.'000) | 153,263 | 140,942 | 135,021 | 168,726 |
| මෙහෙයුම් ලාභය/පාඩුව (රු.'000) | 22,968 | 2,189 | (7,724) | (16,024) |
| පෙර වර්ෂ ගැලපීම් (රු.'000) | (335) | (15,112) | (1,141) | (1,526) |
| ශුද්ධ ලාභය/(පාඩුව) (රු.'000) | 22,633 | (12,923) | (8,865) | (17,550) |

| | | | | |
|---|---|---|---|---|
| තේ කිලෝග්‍රෑමයකට නිෂ්පාදන පිරිවැය (රු.) | 411.49 | 413.43 | 405.25 | 395.24 |
| හෙක්ටයාරයකට ඉපයීම් (කිලෝග්‍රෑම්) | 2,293 | 2,444 | 774 | 1,002 |
| ශුද්ධ විකුණුම් සාමාන්‍යය (කිලෝග්‍රෑමයකට රු.) | 455.29 | 405.78 | 388.37 | 359.31 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ශාන්ත කුම්බ්ස් වතුයායේ විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 32,581 කින් වැඩි වී තිබුණු අතර මෙහෙයුම් ලාභයද රුපියල් මිලියන 20.78 කින් වැඩි වී තිබුණි. විකුණුම් රු.මිලියන 32.38 කින් වැඩිවීම සහ සාමාන්‍ය ගාස්තු රු.මිලියන 11.73 කින් අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ශාන්ත ජෝකිම් වතුයායේ විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 113,222 කින් අඩු වී තිබුණු අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී මෙහෙයුම් අලාභය රු.මිලියන 8.3 කින් අඩු වී තිබුණි.
කම්හල් ගිණුම් අනුව, සමාලෝචිත වර්ෂයේ තේ වතුයායෙන් රු.මිලියන 7.25 කින් හා තේ කම්හලෙන් රු.මිලියන 3.96 කින් සමන්විත පාඩුවක් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය. තවද, රබර් වතුයායෙන් රු.මිලියන 2.1 ක ලාභයක් උපයාගෙන තිබුණු නමුත් වතුයායට අයත් කුඹුරු ඉඩම්වලින් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ලබාගත හැකි වූ තොරතුරු අනුව, ශාන්ත කුම්බ්ස් වතුයායේ හා ශාන්ත ජෝකිම් වතුයායේ යන්ත්‍ර ධාරිතාවය පිළිවෙලින් කොළ තේ දිනකට කිලෝ ග්‍රෑම් 10,000 ක් හා කිලෝ ග්‍රෑම් 15,000 ක් විය. කෙසේ වුවද එම යන්ත්‍රවල තථ්‍ය සාමාන්‍ය උපයෝජනය පිළිවෙලින් දිනකට කිලෝග්‍රෑම් 6250 (62.5%) ක් සහ කිලෝ ග්‍රෑම් 3,500 (23.33%) ක් බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

(අ) ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ මූලා කාර්ය සාධනය පහත දැක්වේ.

| වැඩ සටහන | වර්ෂය සඳහා ප්‍රතිපාදනය | | | උපයෝජනය | | | උපයෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | එකතුව | පුනරාවර්තන | ප්‍රාග්ධන | එකතුව | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| ඵලදාව වැඩි දියුණු කිරීම | 13.49 | 10.57 | 24.06 | 11.75 | 06.91 | 18.66 | 78 |
| ඉඩම් ඵලදායිතාවය වැඩිදියුණු කිරීම | 16.99 | 10.72 | 27.71 | 21.58 | 04.42 | 26.00 | 94 |
| දේශගුණික වෙනස්වීම් බලපෑම තක්සේරු කිරීම | 01.66 | 01.84 | 03.50 | 01.84 | 0.09 | 01.93 | 55 |
| ක්ෂේත්‍ර පරිචයන් යාන්ත්‍රණය කිරීම | 01.63 | 0.09 | 01.72 | 01.80 | - | 01.8 | 105 |
| ඵලදාව කළමනාකරණය | 09.39 | 07.23 | 16.62 | 10.74 | 02.27 | 13.01 | 78 |
| තේ වේලීම සඳහා විකල්ප බලශක්ති ප්‍රභවයන් | 01.23 | 0.04 | 01.27 | 01.40 | 0.02 | 01.42 | 112 |
| තේ සැකසීම් තාක්ෂණය | 08.06 | 04.45 | 12.51 | 08.03 | 02.36 | 10.39 | 83 |
| සැකසූ තේවල ගුණාත්මක තත්ත්වය | 01.56 | 0.87 | 2.43 | 01.37 | 0.12 | 01.49 | 61 |
| අගය එකතු කළ තේ නිෂ්පාදිත | 04.05 | 04.20 | 08.25 | 04.96 | 02.19 | 07.15 | 87 |
| සම්පත් සැලසුම්කරණය | 05.11 | 0.75 | 5.86 | 03.19 | 0.14 | 03.33 | 57 |
| උනන්දුවක් දක්වන්නන් සඳහා සේවා | 23.82 | 04.70 | 28.52 | 20.04 | 02.12 | 22.16 | 78 |
| අභ්‍යන්තර සේවා සහ නඩත්තුව | 169.60 | 34.95 | 204.55 | 165.40 | 19.75 | 185.15 | 91 |
| පර්යේෂණ කළමනාකරණය | 14.02 | 10.60 | 24.62 | 13.73 | 04.98 | 18.71 | 76 |
| එකතුව | 270.61 | 91.01 | 361.62 | 265.83 | 45.37 | 311.20 | 86 |

(ආ) කම්හල්වල කාර්යයන් ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි. එබැවින් මණ්ඩලයේ කම්හල්වල හා වතුයායවල කාර්යයන් පිළිබඳ ප්‍රගතිය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ඈ) සැලසුම්කළ පරිදි පහත දැක්වෙන විෂයයන් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රසම්පාදනය කර නොතිබුණි.

| | රු. |
|---|---|
| ඔස්මෝ (Osmo) මීටරය | 800,000 |
| ෆියුම් හුඩ් (Fume hood) | 500,000 |
| ෆ්ලැම් ෆොටෝ මීටර් (Flam Photometer) | 1,500,000 |
| | ------------- |
| | 2,800,000 |
| | ======= |

භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන අරමුදල් අඩුකිරීම හේතුවෙන් මෙම විෂයයන් මිලදී ගැනීමට නොහැකි වූ බව මණ්ඩලයේ සභාපතිවරයා දක්වා තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්ම අනුව, හන්තාන නැවත වගා කිරීම සඳහා රු.1,200,000 ක මුදලක් වෙන්කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ මෙම කාර්යය සිදුකර නොතිබුණි. ආරම්භක ගෙවීම රු.180,000 ක් 2012 වර්ෂයේදී ගෙවූ බවත් ඉතිරි ගෙවීම 2013 අයවැයට මාරුකළ බවත් මණ්ඩලයේ සභාපති දන්වා තිබුණි.

**3.2** <u>වත්කම් කළමනාකරණය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබාගත හැකි වූ තොරතුරු අනුව, සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබාගෙන අනිවාර්ය සේවා කාලය සේවය නොකළ නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.27,090,600 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

(ආ) 1982 වර්ෂයේ සිට අඩු තේ සැකසුම් ව්‍යාපෘතිය (Lowery Tea Processing Project) ලෙස කෙරීගෙන යන වැඩ ගිණුම යටතේ රු. 4,142,173 ක මුදලක් ගිණුම්වල පෙන්වා තිබුණි. ලබාගත හැකි වූ තොරතුරු අනුව, ශ්‍රී ලංකා තේ සැකසුම් ක්‍රියාවලියේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා උඩරට තේ කම්හල් 06 ක යන්ත්‍ර 06 ක් සවිකර තිබුණු අතර ව්‍යාපෘතිය යටතේ මිලදී ගන්නා ලද එම යන්ත්‍ර ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය සඳහා යෝග්‍ය නොවීම හේතුවෙන් එම ව්‍යාපෘතිය අත්හැර දමා තිබුණි. කෙසේ වුවද එම යන්ත්‍ර සවි කරන ලද කම්හල්වල තවමත් නිෂ්කාර්යව පවතින අතර දීර්ඝ කාලයක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) ශාන්ත ජෝකිම් වතුයායේ හෙක්ටයාර් 143.810 ක් වූ මුළු ඉඩම් වපසරියෙන් හෙක්ටයාර් 17.675 ක් බාහිර පාර්ශවයන් විසින් බලයෙන් අල්ලාගෙන ස්ථිර නිවාස

ඉදිකර වී,තේ, රබර්, පොල් හා වෙනත් භෝග වගාකර තිබුණි. එබැවින් වතුයාය එම වගාවන්ගෙන් ආදායමක් ලබා නොතිබු අතර එම පුද්ගලයන් ඉඩම් වලින් ඉවත් කිරිමට 2013 මාර්තු 31 දක්වා ඔවුන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) 2011 වර්ෂයේදී මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවේ තීරණයට අනුව, 2005 වර්ෂයේ සිට පොත්වල දැක්වෙන රු.302,893 ක් වටිනාකම වූ විද්‍යාත්මක තොගය අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

මෙම තොගය තුළ හානිදායක රසායනික ද්‍රව්‍ය ප්‍රමාණයක් ඇතුළත් වී ඇති බැවින්, එම තොග විනාශ කිරීමට හා ඉවත් කිරීමට නොහැකි වී ඇති බවත් මේ සඳහා සහාය ලබා ගැනීමට විද්‍යා හා තාක්ෂණ ආයතනයට (ITI) ලියා ඇති බවත් මණ්ඩලයේ සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

(ඉ) ශාන්ත ජෝකිම් වතුයායේ සේවය කරන ලද සේවකයන් දෙදෙනෙකුගේ උසස්වීම් සම්බන්ධයෙන් 2008 වර්ෂයේදී මණ්ඩලයට එරෙහිව රත්නපුර ජාතික වතු සේවා සංගමය විසින් අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පෞද්ගලික නීතිඥවරුන්ට රු.902,000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද 2013 පෙබරවාරි මාසයේදී මණ්ඩලය විසින් නඩුව ඉවත් කරගෙන තිබූ අතර අභියාචනය ඉදිරිපත් කරන ලද සේවකයන් සඳහා එම වැටුප් වර්ධක ගෙවීමට එකඟ වී තිබුණි.

(ඊ) පහත සඳහන් නේවාසික නිල නිවාස 2013 මාර්තු 15 විගණන දිනය වනවිට නිෂ්කාර්යව පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

| වර්ගය | නිෂ්කාර්යව පැවති නිල නිවාස සංඛ්‍යාව |
|---|---|
| A | 01 |
| B | 03 |
| C | 03 |
| D | 22 |
| | 29 |

(උ) මණ්ඩලයේ ලැම්ලියර් වතුයායට අයත් ඉඩම හා කම්හල වර්ෂ 50 ක කාලයකට රු.600,000 ක වාර්ෂික කුලියකට 2003 ජූලි 16 දින පුද්ගලික පාර්ශවයකට බදු දී තිබුණු අතර බදු ගිවිසුමට අනුව රජයේ තක්සේරුකරුගේ තක්සේරුව යටතේ සෑම වර්ෂ 05 කදීම බදු කුලිය සංශෝධනය කළයුතු විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා බදු කුලිය සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

බදු කුලිය නොගෙවීම සම්බන්ධයෙන් හා කුලිය සංශෝධනය කිරීම වෙනුවට වර්තමාන බදුකරු ඉවත් කිරීම සඳහා අධිකරණ නඩුවක් පවතින බව මණ්ඩලයේ සභාපති දන්වා තිබුණි.

(ඌ) වලහන්දුව ව්‍යාප්ත මධ්‍යස්ථානයට දී තිබුණ මුදල් අග්‍රිමය රු.50,000 ක් වුවද 2012 දෙසැම්බර් 31 දිනට මුදල් අග්‍රිම ශේෂය රු.73,059 ක් විය. එබැවින් කිසිදු අනුමැතියක් නොමැතිව රු.23,059 කින් අග්‍රිමය ඉක්මවා තිබූ බව නිරීක්ෂණය විය.

(එ) පස් පර්යේෂණ කටයුතු සඳහා 2007 වර්ෂයේදී හා 2008 වර්ෂයේදී මෙතිල් බ්‍රොමයිඩ් (Methyl Bromide) ව්‍යාපෘතියෙන් ලැබී තිබුණු අරමුදල් පිළිවෙලින් රු.1,692,750 ක් හා රු.6,950,302 ක් විය. 2010 මාර්තු 30 දිනට සේවා කොන්ත්‍රාත් කාලය ඉකුත් වී තිබුණද 2012 දෙසැම්බර් 31 දිනට රු.2,992,170 ක මුදලක් ඉතිරි වී තිබුණි. ව්‍යාපෘති අරමුණු ඉටු කරගත් බවට සාක්ෂි ඉදිරිපත් නොකෙරිණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 අගෝස්තු 24 දිනැති ලිපිය අනුව මණ්ඩලයේ අනුමත කරන ලද නව සේවක සංඛ්‍යාව 443 ක් වන අතර මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තා ප්‍රකාරව 2012 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යා තත්ත්වය පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 43 | 13 | 30 | - |
| ද්විතියික මට්ටම | 120 | 76 | 51 | 07 |
| තෘතියික මට්ටම | 130 | 56 | 74 | - |
| ප්‍රාථමික මට්ටම | 150 | 78 | 72 | - |
| | 443 | 223 | 227 | 07 |

ඉහත තොරතුරු අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 30 ක් ඇතුළුව පුරප්පාඩු 227 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීම සඳහා මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි.

## 3.4 මෝටර් වාහන උපයෝජනය

මෝටර් වාහන, බස්රථ, වෑන්රථ, ජීප්, ත්‍රීවිලර්, ලොරි, ට්‍රැක්ටර් හා යතුරු පැදි වලින් සමන්විත මණ්ඩලයේ වාහන පද්ධතියේ වාහන 117 ක් තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂයකට වැඩි කාලයක් අළුත්වැඩියා කිරීමෙන් තොරව නිෂ්කාර්යව පැවති මෝටර් වාහන 08 ක් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මෝටර් වාහන පද්ධතියට ඇතුළත් කිරීමෙන් තොරව ධාවන තත්ත්වයේ පැවති මෝටර් වාහනයක් නිෂ්කාර්යව තිබුණි.

(ඇ) මණ්ඩලයේ වාහනයකට නව බොඩිකඳක් හා එන්ජිමක් නැවත සවි කිරීමට 2011 මැයි 30 දින පුද්ගලික ගරාජයකට රු.1,650, 000 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද නව බොඩිකඳ සවි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා එන්ජිමක් නැවත සවිකිරීමට මෝටර් වාහන කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම වාහනය නැවතත් මණ්ඩල පරිශ්‍රයේ 2012 ජනවාරි 19 සිට 2013 මාර්තු 13 විගණන දිනය දක්වා නිෂ්කාර්යව තිබූ හෙයින් එම සිදු කරන ලද අළුත්වැඩියා කටයුතු සතුටුදායක වී නොතිබුණි.

**3.5** <u>පාරිතෝෂික ප්‍රතිපාදන ආයෝජනය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) 19, දක්වා ඇති පරිදි අනාගත බැරකම්වලට මුහුණදීම සඳහා මණ්ඩලය විසින් රු.142,640,318 ක් වූ පාරිතෝෂික ප්‍රතිපාදන වෙනම ආයෝජනය කර නොතිබුණි.

2009,2010 හා 2011 වර්ෂ තුළදී එදිනෙදා කාර්යයන් සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි අරමුදල් මුදා නොහැරීම හේතුවෙන් මෙය කළනොහැකි වූ බවත් යථා කාලයේදී අරමුදල් ලැබුණු පසු නිවැරදි මුදල ආයෝජනය කිරීමට කටයුතු කරන බවත් මණ්ඩලයේ සභාපතිවරයා දන්වා තිබුණි.

**4.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

---

**4.1** **සංයුක්ත සැලැස්ම**

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව 2008 – 2012 වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි.

**4.2** **ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම**

---

ක්‍රියාකාරී සැලැස්ම මණ්ඩලයේ භෞතික ඉලක්කයන් සඳහා නොව මූල්‍ය ඉලක්කයන් සඳහා පමණක් පිළියෙල කර තිබුණි. එබැවින් භෞතික ඉලක්කයන් ඉටුකර ගැනීම විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

**5. <u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු වියයුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) අත්තිකාරම් නිරවුල් කිරීම
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ
(ඉ) කම්හල් කළමනාකරණය